# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1781/22 - 2012 ඔක්තෝබර් මස 25 වැනි බ්‍රහස්පතින්දා - 2012.10.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වගන්තිය යටතේ අම්පාර නගර සභාවේ සභිකයකුගේ ධූරයේ පුරප්පාඩුවක් පිරවීම**

නැගෙනහිර පළාතේ පළාත් සභාවට තේරී පත්වීම හේතු කොටගෙන අම්පාර නගර සභාවේ සභිකයකුගේ ධූරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

අබේසුන්දර වික්‍රමසූරිය බූසාබදුගේ නිශාන්ත මංජුල ප්‍රනාන්දු නම් වූ සභිකයා අයත්වන එක්සත් ජාතික පක්ෂය නම් වූ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට, දින තිහක (30) කාල පරිච්ඡේදයක් ඇතුළත සභිකයෙකු වශයෙන් තෝරා පත්කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු වූ , ඒ පක්ෂයට අයත් ඒ අම්පාර නගර සභාවේ සභිකයෙකු වශයෙන් තේරී පත්වීම සඳහා ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තෙකු නාමයෝජනා කිරීමට, ඉහත කී ආඥාපනතේ 65 අ(2) වැනි වගන්තිය යටතේ මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඒ පුරප්පාඩුව පිරවීම සඳහා ඉහත කී ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තකු වන එච්. එච්. මහී ප්‍රසාද් ද සිල්වා මහතා ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් නම් කරනු ලැබ ඇති හෙයින් ද ;

අම්පාර නගර සභාවේ තේරීම් භාර නිලධාරි සිවසුබ්‍රමනියම් අච්චුදන් වන මම, (262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වැනි වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, එච්. එච්. මහී ප්‍රසාද් ද සිල්වා මහතා අම්පාර නගර සභාවේ සභිකයකු වශයෙන් තෝරා පත් කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

එස්. අච්චුදන්,
තේරීම්භාර නිලධාරි,
අම්පාර නගර සභාව.

2012 ඔක්තෝබර් මස 17 වැනි දින,
මැතිවරණ කාර්යාලය,
අම්පාර.

11- 458

1A - G 16808— 350 (2012/10)    ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.